සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය — අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 — 15 S I

# ක්‍රිස්තු ධර්මය I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**
* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. "බලන්න කන්‍යාවක් ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි කරන්නීය. .............................. යන නම ඔහුට තබන්නීය." මෙහි හිස්තැනට උචිත වචනය වනුයේ ,
1. ක්‍රිස්තුන් 2. මෙසියස් 3. ජේසුස් 4. එම්මානුවෙල්

02. ඊශ්‍රායෙල් ඉතිහාසය තුළ ආබ්‍රහම්ගේ පටන් දාවිත් දක්වා පරම්පරා ගණන වන්නේ,
1. 07 කි. 2. 12 කි. 3. 14 කි. 4. 21 කි.

03. "මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියල කරන්නා වූ මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි." ස්නාවක ජොහාන් තුමා පිළිබඳ මෙම දිවැසි වැකිය ප්‍රකාශ කරන ලද්දේ ,
1. මලාකි දිවැසිවරයා 2. මීකා දිවැසිවරයා 3. යෙසයා දිවැසිවරයා 4. සෙකරියා දිවැසිවරයා

04. මිනිසාගේ ජන්ම පාපය නිසා දෙවියන් වහන්සේ හා මිනිසා අතර පලුදු වූ දේව සම්බන්ධතාවය ක්‍රිස්තුන් වහන්සේ විසින් යළි ස්ථාපිත කරන ලද්දේ,
1. උපමා හා දේශනා මඟින්. 2. ක්‍රිස්තුන් වහන්සේගේ මංගගත වීමෙනි.
3. ප්‍රාතිහාර්යයන් හා දේවබල ප්‍රකාශන මගින් . 4. ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පූජාව මඟින්.

05. ජුදෙව් ජන මතයට අනුව සෑම විටම සුබ හසුනක් ගෙනෙනු ලැබූ දේව දූතයා වනුයේ ,
1. මිඛායෙල් දේව දූතයා 2. රෆායෙල් දේව දූතයා 3. ගාබ්‍රියෙල් දේව දූතයා 4. ලුස්ෆර් දේව දූතයා

06. ක්‍රිස්තුන් වහන්සේ උපත ලද දිනදී මහා ජනකායක් බෙත්ලෙහෙම් නුවරට රැස් වී සිටීමට හේතුව වූයේ ,
1. ක්‍රිස්තුන් වහන්සේගේ උපත පිළිබඳ ආරංචි වීම නිසාය.
2. රෝම අධිරාජ්‍යයා පැවැත්වූ සංගනනය නිසාය.
3. රෝම අධිරාජ්‍යයා බැහැ දැකීමටය.
4. පෙරදිග ශාස්ත්‍රවන්තයින්ගේ පැමිණීම නිසාය.

07. සෑම ජුදෙව් නාමයකටම පාහේ අර්ථයක් ඇති අතර ජේසුස් යන නමේ අර්ථය වනුයේ ,
1. දෙවියන් වහන්සේ මුදන සේක 2. දෙවියන් වහන්සේ අප සමඟය
3. ආලේප ලත් තැනැත්තා 4. සමිඳානන් විසින් ඔසවා ගනු ලැබීම

08. කැප කිරීමේ පිළිවෙත ඉටු කිරීමට ජේසු බිළිඳා රැගෙන ආ අවස්ථාවේ දී දේව මාලිගාවේ සිටි පුද්ගලයින් දෙදෙනා වනුයේ,
1. අන්නාස් හා කායාපස් 2. සිමියොන් හා අන්නා 3. අනනියස් හා සපීරා 4. අකිලා හා ප්‍රිස්කිලා

09. දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල් බැඳුමින් මුදවාගෙන මෝසෙස්ගේ නායකත්වය තුළින් කනාන් දේශයට ගෙන ඒමේ සිද්ධිය අනුස්මරණය කරන ලද ජුදා මංගල්‍යය වනුයේ,
1. කැප කිරීමේ මංගල්‍යය 2. පාස්කු මංගල්‍යය
3. පෙන්තකොස්ත මංගල්‍යය 4. කූඩාරම් මංගල්‍යය

10. කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පොළා සිය අටුවේ රැස් කරන පිනිසත් උන්වහන්සේගේ අතේ කුල්ල ඇත. ශුද්ධ ලුක් තුමා සඳහන් කරන මෙම බයිබල් පාඨය තුළින් පැහැදිලි වන කරුණ වනුයේ ,
1. දෙවියන් වහන්සේ අපට නියම කලට නියම අස්වනු ලබා දෙන බව.
2. මිනිස් ජීවිතයේ අවසන් තීරණය ගැනෙන්නේ ජේසුස් වහන්සේ විසින් බව.
3. සියලු යහපතේ ස්වාමියානන් දෙවියන් වහන්සේ බව.
4. අප මෙලොව උපයන සියල්ල දෙවියන්ට අයිති බව.

11. ශුද්ධ දේශය මත රෝම පාලනය ප්‍රතික්ෂේප කළ විප්ලවකාරී එම පාලනයට එරෙහිව ක්‍රියා කළ ක්‍රිස්තු ශ්‍රාවකයා වනුයේ,
1. ජාකොබ් 2. තෝමස් 3. ජුදස් 4. සීමෝන්

12. පලස්තීනය පුරා පැවති ධර්මශාලා පරිසිවරුන්ගේ මධ්‍යස්ථානය වූ අතර සද්දුසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය වූයේ ,
1. සිනගෝග 2. සැන්හෙන්ඩ්‍රියන් අධිකරණය
3. ජෙරුසෙලම් දේව මාළිගය 4. ගෙත්සෙමනිය

13. දොලොස් දෙනාගෙන් කෙනෙක් ජේසුස් වහන්සේ පාවා දෙන බවට ජේසු වහන්සේ විසින් පෙර ඇඟවීම් කරන ලද්දේ,
1. අන්තිම රාත්‍රී භෝජනයේදීය 2. පේදුරුගේ මහා ප්‍රකාශනයේ දීය
3. මල් උයනේ යාච්ඤාවේදීය 4. කුරුස ගසේ දීය

14. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය වූ සැන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාවේ සාමාජික ගණන වූයේ ,
1. 07 කි 2. 12 කි 3. 70 කි 4. 120 කි

15. සද්දුසි පාර්ශවය ව්‍යවස්ථාවේ කතුවරයාණන් ලෙස පිළිගෙන තිබුනේ ,
1. ආබ්‍රහම් 2. ජෝසප් 3. මෝසෙස් 4. එලියා

16. "ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයානෝය " ජේසුස් වහන්සේට මෙම ප්‍රකාශය කරන ලද්දේ ,
1. ශතාධිපතියා විසිනි. 2. නායක පූජකයන් විසිනි. 3. පේදුරු තුමා විසිනි. 4. හෙරෝද් රජු විසිනි.

17. ජේසුස් වහන්සේ පාළුකරයේ පරීක්ෂා වලට මුහුණ දුන් අවස්ථාවේ තෙවන පරීක්ෂාවේ දී යක්ෂයා ජේසුස් වහන්සේව පෙළඹවීමට යොදාගත් ශුද්ධ ලියවිලි ග්‍රන්ථය වනුයේ,
1. නික්මයාම 2. ද්විතීය නීති සංග්‍රහය 3. ජෝබ් 4. ගීතාවලිය

18. ජේසුස් වහන්සේගේ රූප විපර්යාස අවස්ථාවේ උන්වහන්සේ සමඟ සිටි ශ්‍රාවකයින් වනුයේ,
1. පේදුරු , සීමොන් , ඇන්ඩෘ 2. පේදුරු , ජොහාන් , ජාකොබ්
3. ඇන්ඩෘ , තෝමස් , පිලිප් 4. සීමෝන් , ජාකොබ් , ජුදස්

19. ග්‍රීක බසින් ප්‍රාතිහාර්යයන් හැඳින්වීම සඳහා සුභාරංචි කතුවරුන් භාවිතා කරන වචනය "ඩුනෝමිස්" යන්නයි. එලෙස ප්‍රාතිහාර්යයන් හැඳින්වීමට ජොහාන් භාවිතා කරන වදන වන්නේ,
1. බෙසෝරා 2. බෙරීක් 3. සිනෝප්ටික් 4. සේමෙයියෝන්

20. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්යයන් අතර සුභාරංචි වාර්තා කරන මරණින් උත්ථාන කිරීමේ සිදුවීම් ගණන වනුයේ,
1. 3 කි. 2. 4 කි. 3. 5 කි. 4. 7 කි.

21. මිනිසා දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් කළ යුතු පරම යුතුකම් හා වගකීම් අඩංගු දස පණතේ දේව පණත් ගණන වනුයේ,
1. 2 කි. 2. 3 කි. 3. 4 කි. 4. 5 කි.

22. මෂියා හෙවත් මෙසියස් යන ග්‍රීක වචනයේ අර්ථය වනුයේ ,
1. කැඳවා ගනු ලබන තැනැත්තා 2. ආලේප ලත් තැනැත්තා
3. තෝරාගත් තැනැත්තා 4. ගලවා ගනු ලැබූ තැනැත්තා

23. ප්‍රේමය පිලිබඳව පාවුළු තුමා ලියූ ප්‍රේම පාරමිතාව අඩංගු සංදේශය වනුයේ,
1. ගලාති 2. එපිස 3. කොරෙන්ති 4. තිමෝති

24. "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය, ඔවුහු දේව දූතයෝ යැයි කියනු ලබන්නෝය" ජේසුස් වහන්සේ මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ ,
1. තැනිතලාවේ දේශනාවේ දීය. 2. කන්ද උඩ දේශනාවේ දිය.
3. දේව මාළිගාව පවිත්‍ර කිරීමේ දීය. 4. කුරුස ගසේදීය.

25. "පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහාය" යන උදාර ආකල්පය තුළ සියලු ජාතීන් වෙනුවෙන් තම ලැගුම් ගෙය පවා පරිත්‍යාග කල පූජකයා වූයේ ,
1. ගරු චන්ද්‍ර ප්‍රනාන්දු පියතුමා 2. ගරු තිස්ස බාලසූරිය පියතුමා
3. ගරු පීටර් ජෙරාඩ් ද සිල්වා දේව ගැතිතුමා 4. ගරු මයිකල් රුද්‍රිගෝ පියතුමා

26. තමාට වරද කරන සහෝදරයාට සත් වාරයක් දක්වා සමාව දීමෙන් පමනක් ජුදෙව්වරයෙකු ලෙස සැහීමකට පත් විය හැකිදැයි ජේසුස් වහන්සේගෙන් විමසන ලද්දේ ,
1. නිකදේමුස් 2. පේදුරු තුමා 3. ශතාධිපතියා 4. දකුණු පස සිටි සොරා

27. දේව වරප්‍රසාදය තුළ ගැළවීම ලැබූ තැනැත්තන් බාහිර පිලිවෙත් කරන කොට ගෙන විජාතීන් ලෙස වෙන් කළ නොහැකි බව පාවුළු තුමා ප්‍රකාශ කරනුයේ,
1. එපීසවරුන්ටය. 2. රෝමවරුන්ටය. 3. කොරෙන්ති වැසියන්ටය. 4. පිලිප්පි වැසියන්ටය.

28. ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් හෙවත් කිතුනු පාස්කුවෙන් දින 50 කට පසුව පැවැත්වෙන ජුදෙව් කෘෂිකාර්මික මංගල්‍යය වනුයේ ,
1. කූඩාරම් මංගල්‍යය. 2. පෙන්ත කොස්ත මංගල්‍යය.
3. මොර්දෙකයි මංගල්‍යය. 4. කැප කිරීමේ මංගල්‍යය.

29. තමා සතු වතු පිටි හා දේපල විකුනා මුල්සභා නායකයින් හට ගෙනවිත් භාර දුන් ධනවත් ලෙව්වරයා වූයේ ,
1. අනනියස් 2. ස්තේපන් 3. බර්ණබස් හෙවත් ජෝසප් 4. සරිගියස් පාවුළු

30. "රන් වත් රිදී වත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි. නමුත් නසාරිය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න. " මෙසේ කොරව සිටි මිනිසෙකු සුව කරන ලද්දේ,
1. පාවුළු හා පේදුරු 2. පේදුරු හා ජොහාන් 3. ජාකොබ් හා පාවුළු 4. බර්ණබස් හා පාවුළු

31. ශුද්ධ පාවුළු තුමා උපන් තාර්සස් නුවර පිහිටා තිබූ රට වනුයේ ,
1. අසිරියාව 2. සිලිසියාව 3. සිරියාව 4. ග්‍රීසිය

32. පරිසි පවුලක උපත ලද පාවුළු තුමා ජුදෙව් ආගමික වත් පිළිවෙත් හා නීති රීති පිළිපැදි බවට නිදසුනක් වනුයේ,
1. ස්තේපන්ට ගල් ගසන අවස්ථාවේ ඊට සාක්ෂිකරුවෙකු වීම. 2. තිමෝතියස් චර්මඡේදනය කිරීම.
3. සැන්හෙන්ඩ්‍රින් සභා සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම. 4. ධර්මදූත චාරිකා වල නිරත වීම.

33. පාවුළුතුමාට තම පළමු ධර්මදූත ගමනේ දී සර්ගියස් පාවුලස් නම් බුද්ධිමත් දේශාධිපතියා මුණ ගැසුණේ ,
1. සයිප්‍රසය 2. පාපස් 3. පම්පිලියේ පර්ගා 4. පිසීදියේ අන්තියෝකිය

34. ලොව පුදුම හතෙන් එකක් ලෙස සැලකෙන ප්‍රසිද්ධ අර්තේමියස් දේවාලය පිහිටා තිබූ මෙය පාවුළු තුමාගේ තෙවන ධර්ම දූත චාරිකාවේ ප්‍රධාන නගරයකි.
1. එපීසිය 2. කොරෙන්තිය 3. ගලාතිය 4. පිලිප්පිය

35. "ගුරු දේවයිනි , ඔබ දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ ගුරුවරයෙක් යැයි අපි දනිමු. මන්ද දෙවියන් වහන්සේ තමා සමඟ නොසිටින සේක් නම් කිසිවෙකුට ඔබ කරන මේ හාස්කම් කළ නොහැක." ජේසුස් වහන්සේට මෙලෙස පැවසුයේ,
1. පේදුරු තුමා 2. පාවුළු තුමා 3. නිකදේමුස් 4. පිලාත්

36. උප්පත්ති පොතට අනුව දූවිල්ලෙන් සෑදුන මනුෂ්‍යා ජීවමාන කෙනෙකු බවට පත් වූයේ,
1. ස්ත්‍රිය මැවීමත් සමඟය. 2. නාස් පුඩු වලට ජීවන හුස්ම හෙලීමෙනි .
3. හම් වස්ත්‍ර සාදා ඇන්දවීමෙනි. 4. ආදම් යැයි නම් තැබීමෙනි.

37. දෙවියන් වහන්සේ ගේ ප්‍රේමය ජුදෙව්වන්ට පමනක් ලබා දෙන ප්‍රේමයක් නොවන බව පෙන්වීමට ජේසුස් වහන්සේගේ ජීවිතයේ වූ සිදුවීමකි.
1. ජේසුස් වහන්සේ 5000 කට කෑම දීම. 2. ජේසුස් වහන්සේ හා සමාරිය ස්ත්‍රීන් අතර දෙබස.
3. කානා නුවර වතුර මිදිරසට හැරවීම . 4. ජේසුස් වහන්සේ දේව මාලිගාව පවිත්‍ර කිරීම..

38. ආමොසේ දිවැසිවරයා සේවය කළ සමය උතුරු ඊශ්‍රායල් ජාතියේ පාලකයා වූයේ,
1. පළමු රෙහෙබොවාම් 2. දෙවන ජෙරබෝවාම් 3. ආහාස් 4. ජොහොයාකිම්

39. සමාජ සාධාරණත්වය පිළිබඳ කතා කරන දිවැසිවරුන් වදාළ දිවැසි වැකි කීපයක් පහත දක්වේ.
A- ඔබලා ණය ගෙවා ගන්නට බැරි නිදොස් අය මුදලටත් දුප්පත් අසරණයන් සෙරෙප්පු දෙකට මිලයටත් වහල් කමට වික්කේය.
B- යුක්තිය ගලා බසින දිය දහරක් මෙන්ද ධර්මිෂ්ඨකම නොසිදී ගලන ගඟක් මෙන්ද පැවතිය යුතුය.
C- පිපාස ඇති සියල්ලෙහි ඇල දොල වෙත පැමිණෙන්න. මුදල් නැති තැනැත්තෙනි, එන්න අරගන්න වලදන්න.
D- නුඹලාගේ මංගල්‍යවලට ද්වේශ කරමි. ඒවා මට රුස්සන්නේ නැත.

මින් ආමෝස් වදාල දිවැසි වැකි පමණක් ඇතුලත් වරණය වනුයේ,
1. A ,B ,C 2. B ,C ,D 3. C ,D ,A 4. A ,B ,D

40. "මෙන්න මා මෙහිය මා යැව්ව මැනව." මෙලෙස තම දිවැසි කැඳවීමට ප්‍රතිචාර දක්වූ දිවැසිවරයා වනුයේ ,
1. යෙසායා 2. ජෙරමියා 3. එසකියෙල් 4. ආමෝස්

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 15 S II

## ක්‍රිස්තු ධර්මය II

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 4 ක් පමණක් තෝරා ගෙන සියලුම ප්‍රශ්න 5 ක් වන ලෙස පිළිතුරු සපයන්න.

(01) i. ගැළවුම්කරුවාණන් පිළිබඳ දිවැසි වැකි කී දිවැසිවරුන් දෙදෙනෙක් නම් කරන්න.
ii. ක්‍රිස්තු උපත පිළිබඳ ප්‍රකාශිත අනාවැකිය තුළ සඳහන් ඊශ්‍රයෙල් රජතුමා හා ආදිපිතෘවරයා නම් කරන්න.
iii. පලස්තීන කුළුඳුලන් කැප කිරීමේ පිළිවෙතේ දී පූජා කිරීමට නියමිත ව තිබූ සත්වයින් වර්ග 2 ක ලියන්න.
iv. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් අතර සෙබදීගේ පුතුන් දෙදෙනා නම් කරන්න.
v. පරිසවරුන් ප්‍රචලිත කළ අදහස් අතර සද්දූසිවරුන් පිළිනොගන්නා ප්‍රධාන මතවාද 2 නම් කරන්න.
vi. ඊශ්‍රායෙල් ඉතිහාසය තුළ තෙලින් ආලේප ලබා සේවය සඳහා සුදානම් වූ ජන කණ්ඩායම් 2 ක් නම් කරන්න.
vii. ශුද්ධ මාක් සුභාරංචියට අනුව ජේසුස් වහන්සේ වාදාළ ප්‍රේමයේ පනත් 2 ලියන්න.
viii. සිරියාවේ අන්තියෝකියේ පිහිටි සභාවේ සේවය කළ ප්‍රධාන කණ්ඩායම් 2 ලියන්න.
ix. ශුද්ධ පාවුළු තුමා සමඟ පළමු ධර්මදූත ගමනට එක් වූ සහයකයන් දෙදෙනා නම් කරන්න.
x. දෙවියන් වහන්සේ මිනිසාට මවා දුන් සහකාරිය කවුද? එම නාමයේ අර්ථය ලියන්න. (2x10=20)

(02) i. ගැළවුම්කරුවානන් හඳුන්වන හිබෲ හා ග්‍රීක වචන දෙක නම් කරන්න.
ii. අන්නා දිවැසිවරිය පිළිබඳ කරුණු 3 ක් ලියන්න.
iii. ජේසුස් වහන්සේගේ නාසරෙත් හී දේශනාව තුළ උන්වහන්සේගේ සේවය ගලා යන පාර්ශව 5 නම් කර ඒ එක් එක් කණ්ඩායම ලබන ගැලවීම කෙටියෙන් පහදන්න.

(03) i. ජේසුස් වහන්සේ අන්‍යරූප විලාශ වූ මොහොතේ උන්වහන්සේ දෙපස දර්ශනය වූ පුද්ගලයින් දෙදෙනා නම් කරන්න.
ii. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති හා අපේක්ෂයා දක්වන උපමා 3 ක් ලියන්න.
iii. ලෞකික සම්පත් ගැන කරදර නොවී ධර්මිෂ්ඨකම හා අධ්‍යාත්මික සැප රැස් කිරීමට ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම් 5 ක් ලියන්න.

(04) i. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට අත් හැරීමට කියූ දේවල් 2 ක් ලියන්න.
ii. මිනිසා හා මිනිසා අතර පැවතිය යුතු ගුණ ධර්ම සඳහන් පණත් 3 ක් ලියන්න.
iii. රජකම හා බැඳුණු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ 5 ක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න.

(05) i. "එඬේරා" පිළිබඳ සංකල්පය පැහැදිලිවම සඳහන් කරන පැරණි ගිවිසුම් ග්‍රන්ථ 2 ක් ලියන්න.
ii. පුරාණ ඊශ්‍රායෙල් එඬේරුන්ගේ ප්‍රධාන ගුණාංග 3 ක් ලියන්න.
iii. ශුද්ධ සභාවේ බැටළුවන් වන අප ලෝකයේ නපුරාට හසු නොවී දිවි ගෙවීමට ක්‍රියා කළ යුතු ආකාර 5 ක් ලියන්න.

(06) i. ශුද්ධ පාවුළු තුමා ප්‍රේමය පිළිබඳ ඉගැන්වූ සංදේශ 02 ක් ලියන්න.
ii. ශුද්ධ පාවුළු තුමා ප්‍රේමයේ ගැඹුරු බව හඟවන ප්‍රේමයේ ගුණාංග 3 ක් ලියන්න.
iii. "කිතුනු අපගේ ජීවිත වල පදනම ප්‍රේමයයි" ඔබ ජීවත් වන සමාජය තුළ ප්‍රේමයේ දිවියක් ගත කිරීමට ඔබ කරන යෝජනා 5 ක් ලියා කෙටියෙන් විස්තර කරන්න.

(07) පහත මාතෘකා අතුරින් 2 ක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
i. පරිසිවරයෙකු ලෙස පාවුළු තුමාගේ ආගමික පසුබිම
ii. භාර්‍යාව හා ස්වාමිපුරුෂයාගේ වගකීම් නව ගිවිසුම් දැක්මෙන්
iii. අධ්‍යාත්මික දිළිදුබව හා ක්‍රිස්තු ඉගැන්වීම
iv. යෙසායාගේ කැඳවීම (5x2=10)

**අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018**
**ක්‍රිස්තු ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 3 | 31. | 2 |
| 02. | 3 | 12. | 3 | 22. | 2 | 32. | 2 |
| 03. | 1 | 13. | 1 | 23. | 3 | 33. | 2 |
| 04. | 4 | 14. | 3 | 24. | 2 | 34. | 1 |
| 05. | 3 | 15. | 3 | 25. | 1 | 35. | 3 |
| 06. | 2 | 16. | 3 | 26. | 2 | 36. | 2 |
| 07. | 1 | 17. | 4 | 27. | 1 | 37. | 2 |
| 08. | 2 | 18. | 2 | 28. | 2 | 38. | 2 |
| 09. | 2 | 19. | 4 | 29. | 3 | 39. | 4 |
| 10. | 2 | 20. | 1 | 30. | 2 | 40. | 1 |

## II කොටස

(01) i. යෙසායා , මීකා
ii. දාවිත් , ජාකොබ්
iii. පරවියන් , කොබෙයියන්
iv. ජාකොබ් , ජොහාන්
v. දේව දූතයන් , පුනර්ජීවනය
vi. පූජකයින් , දිවැසිවරුන්
vii. * තමාගේ මුළු ජීවිතයෙන්ම දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම
* තමාට මෙන් තම අසල්වැසියාට ප්‍රේම කිරීම
viii. දිවැසිවරුන් හා ගුරුවරුන්
ix. බර්ණබස් හා ජොහාන් මාක්
x. * ඒව * ජීවමාන සියල්ලන්ගේ මාතාව

(02) i. * මෂියා - හීබෲ * ක්‍රිස්තෝස් - ග්‍රීක

ii. * ක්‍රිස්තුන් වහන්සේ දේව මාලිගාවේ කැප කරන මොහොතේ සිටි දිවැසිවරයා
* දේව මාළිගාවේ නිරන්තර යාච්ඤාවේ යෙදී සිටියාය
* උපවාසයෙන් හා බැදුමෙන් දේව සම්බන්ධතාව අපේක්ෂා කලාය
* දේව මාළිගාවේ නමස්කාරයේ යෙදි සිටියාය

iii. * දිළින්දන් - සමාජය තුළ පෑගී සිටින දිලින්දා රකින්නට , ඇසුරු කරන්නට තමන් වහන්සේ ආලේප කර ඇති බව.
* වහලුන් - දේව ස්වරූපයෙන් මවනු ලැබූ මිනිසා විවිධ බලවේග වලට බැදී සිටියද ස්වාමීන් වහන්සේ එම බැදීම් සියල්ල නිදහස් කරන බව.
* අන්ධයින් - ශාරීරික මානසික අධ්‍යාත්මික ව හරි දේ නොදකින්නට හරි මග පෙන්වීම.
* පීඩිතයින් - පීඩිත වූවන්ට ප්‍රීතියෙන් ජීවත් වීමේ
* මුළු ජනතාව - පාපයට යටත් සියල්ලන්ට මිදීම දීම.

(03) i. මෝසෙස් හා එලියා
ii. නැතිවූ පුත්‍රයා , නැතිවූ බැටළුවා , නැතිවූ කාසිය , මහා මංගල භෝජනය
iii. * ඔබ සතු දේ දන් දෙන්න- නොදිරන පසුබිම් ද නොදිරන වස්තු ද ස්වර්ගයේ ඔබට සපයා ගන්න
* අහෝ දූන් ධනවත් ඔබට වන විපතක මහත
* ධනවතෙකුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීමට වඩා ඔටුවකුට ඉදිකටු මලින් රිංගා යාම පහසුය.
* ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කිරීමට කිසිවෙකුට නුපුළුවන.
* දෙවියන් වහන්සේට හා වස්තුවට සේවය කිරීමට ඔබට නොහැක.

(04) i. මව්බිම / නෑදෑයින් / පියාගේ ගෘහය
ii. * පියාටද මවටද ගෞරව කිරීම * මිනී නොමරව
* කාමමිථ්‍යාචාරය නොකරව * සොරකම් නොකරව
* අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව
* අසල්වැසියා සතු කිසිවකට ඇළුම් නොකරව

iii. * දාවිත් රජු පරපුරෙන් පැමිණෙන මෙසියස් වහන්සේ පිළිබඳ යෙසායා 9:7 ඉඟිය
* මෙසියස් වහන්සේගේ රාජ්‍යය සදාකාලික බව
* මෙසියානික රාජ්‍යය තුළ සාධාරණත්වය හා යුක්තිය ඇති බව
* මෙසියස් වහන්සේ බරක් වූ විය දන්ඩ කඩා දමා විමුක්තිය උදා කරන බව
* මෙසියස් තුමා අසිරිමත් උපදේශකයානෝය
* මෙසියස් තුමා සාමයේ කුමරානෝය

(05) i. ගීතාවලිය හා එසකියෙල්

ii. * බැටළුවන් පෝෂණය කිරීම * බැටළුවන්ට මඟ පෙන්වීම
* රැක බලා ගැනීම * නැතිවූ බැටළුවන් සොයා යාම
* බැටළුවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් තම ජීවිතය කැප කිරීම
* බැටළුවන්ට සංවේදි වීම හා උන් හඳුනා ගැනීම

iii. * සභා එඬේරුන්ගේ හඬට සවන් දීම (ජොහාන් 10:4:5)
* එඬේරුන්ගේ හඬට පිටුපා නොයාම හා එය අන්තරාදායක බව තේරුම් ගැනීම (ජොහාන් 10:8)
* විශ්වාසවන්ත වීම හා පූර්ණ ජිවනය අත්දැකීම්
* බැටළු එඬේරානන් හට කීකරු වීම (ජොහාන් 10:10)
* අයහපත් එඬේරුන් තේරුම් ගනිමින් යහපත් එඬේරුන්ට විශ්වාසවන්ත වීම

(06) i. කොරොන්ති / එපීස

ii. ඉවසිලිවන්තය , කරුණාවන්තය , ඊර්ෂයා වන්නේ නැත , පාරට්ටු කරන්නේ නැත , උඩඟු වන්නේ නැත, ආත්මාර්ථකාමී නොවේ. (Iකොරොන්ති 13:1-13)

iii. * භේද නොතකා දුබලයින් පහත නොහෙළා පිළිගැනීම.
* අන් අය වෙනුවෙන් වැය වීම , කැප වීම.
* ප්‍රේමය තුළින් වෛරයේ කුරිරුකමේ ගිනි ජාලා නිවා දැමිය යුතුය.
* කරදර වලට පත් වූවන්ට බුද්ධිමත්ව තිරණ ගැනීමට සහය වීම.
* තේරුම් ගැනීම තුළ එකිනෙකාට ගෞරවයෙන් සැලකීම.

(07) i. * පරිසිවරු අන් ආගමික කන්ඩායම් වලින් වෙන්ව උසස්ව ජිවත් වූවන්ය.
* පරිසි යනු වෙන් වූ යන්නය.
* පරිසිවරු ජුදා ආගමික නීතිය ජනතාවට පිලිගැන්වූවෝය.
* ජුදෙව් ආගමික වත් පිළිවෙත් ඉටු කළහ.
උදා:- කෙන්ත්‍රෙයාවේ දී හිස මුඩු කිරීම / තිමෝතියස් චර්මඡේදනය කිරීම.
* ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය වූ සැන්හෙන්ඩ්‍රින් සභා සාමාජිකයෙකි.
* පඩිවරයෙකු වීම පසුකාලීන ධර්මදූත සේවයට වාසිදායක විය.

ii. * ක්‍රිස්තුන් වහන්සේට ඇති ගෞරවය නිසා එකිනෙකාට යටත් වන්න.
* භාර්යාවෙනි , ඔබ සමිදානන් වහන්සේට මෙන් ස්වාමිපුරුෂයාට යටත්ව සිටින්න.
* පුරුෂයිනි , ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් සිය දිවි පුද කලාක් මෙන් ඔබත් ඔබගේ භාර්යාවට ප්‍රේම කරන්න.
* පුරුෂයින් විසින් සිය භාර්යාවට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතුය.

iii. * ලෞකික වස්තු තාවකාලිකය * මෙලොව ජීවිතය තාවකාලිකය.
* මෙලොව ජීවිතයේ අවශ්‍යතා වැඩිවන කළ තන්හාවද වැඩි වේ.
* දරිද්‍රතාව වැඩිවන විට අධ්‍යාත්මික දිළිඳුකම ද ඇති වේ.
* ධනවත් ප්‍රධානියා පිළිබඳ ඉගැන්වීම හා ධනපතියා හා ලාසරුඩ
* මෙලොව ධනවත් වීම හා දිළිඳු වීම ස්වර්ගය ලබා ගැනීමට සුදුසුකමක් නොවේ.
* මෙලොව වස්තු රැස් කර නොගන්න. මලකඩ ද කාවෝ ද ඒවා කා දමති. ඔබේ වස්තුව කොතැනද ඕකත් එතැනය.

iv. * ශුද්ධ දේව මාලිගාවේදී කැඳවීම ලබයි.
* ඔහු දුටු දර්ශනය තුලින් පව් කමා කර ඔහු කැප කරනු ලබයි.
* තමන් කාලකන්ණියෙක් බවත් අපවිත්‍ර තොල් ඇත්තෙක් බවත් යෙසායා පවසයි.
* ගිනි අඟුරක් සෙරොප්වරයෙකු යෙසායාගේ මුඛයේ තවරා ඔහුගේ පාප කමා කරයි.